**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10 ශ්‍රේණිය**

## 5.0 මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරයි.

## 5.2 බැංකු ගනුදෙනු බැංකු ගිණුමේ වාර්තා කරයි.

**පැවරුම 5**

1. ව්‍යාපාරිකයන් ජංගම ගිණුමක් පවත්වාගෙන යාමට වැඩි උනන්දුවක් දක්වන්නේ ඇයි?
2. ණයගැතියෙකුගෙන් ලද චෙක්පතක් ඒ අවස්ථාවේදීම බැංකුවේ තැන්පත් කලවිට ද්විත්ව සටහන ලියා දක්වන්න.
3. චෙක්පතක් අගරු වීමට හේතු මොනවාද?
4. බැංකු අයිරාව යනු කුමක්ද?
5. සේනසිංහ ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු මෙසේය.

| | |
|---|---|
| 01.01 | බැංකු ශේෂය රු 150 000 |
| 01.01 | මුදල් ශේෂය රු 200 000 |
| 01.03 | අත්පිට ගැනුම් රු 70 000 |
| 01.05 | විකුණුම් රු 40 000 කි.ඒ සඳහා චෙක්පතක් ලැබුණි. |
| 01.07 | සරත්ට රු 25 000 ක් චෙක්පතකින් ගෙව්වා |
| 01.08 | බැංකුණය වාරිකය ගෙව්වා රු 20 000 |
| 01.12 | රු 30 000ක් බැංකුවේ තැන්පත් කලා. |
| 01.13 | විකුණුම් වලින් ලද චෙක්පත බැංකුවේ තැන්පත් කලා. |
| 01.15 | රක්ෂණ වාරිකය චෙක්පතකින් ගෙව්වා රු 3 000 |
| 01.19 | බැංකුවෙන් රු 50 000ක් ගත්තා |
| 01.21 | ණයගැතියෙකු වූ තිසරගෙන් ලද රු 15 000ක චෙක්පත එදිනම බැංකුවේ තැන්පත් කලා |
| 01.25 | සරත්ට නිකුත්කල චෙක්පත අගරු වීම |
| 01.27 | අළුතවැඩියා කටයුතු සඳහා රු 10 000 ක් චෙක්පතකින් ගෙව්වා. |

අවශ්‍ය වන්නේ

1.බැංකු ගිණුම මුදල් පොත ඇතුළුව ලෙජරයේ සියලු ගිණුම් පිළියෙල කරන්න.

2.බැංකු ගිණුමේ වාර්තා නොවන ගනුදෙනු මොනවාද?

6. දේවප්‍රිය විසින් ආරම්භ කල ව්‍යාපාරයේ 2021 මාර්තු මස සිදු වූ ගනුදෙනු මෙසේය.

03.01 බැංකු ශේෂය රු 15 000

03.03 මුදල් තැන්පත් කලා රු 7 000

**චෙක් තැන්පතු**

03.07 නිමල්ගෙන් ලද චෙක්පත රු 4 000

03.15 විකුණුම් සඳහා රු 8 000ක චෙක්පතක් ලැබුණා

03.28 ගොඩනැගිලි කුලී ආදායම් සඳහා ලද චෙක්පත රු 6 000

**චෙක් නිකුතු**

03.11 ගැනුම් සඳහා රු 32 000

03.17 තිලක්ට ගෙව්වා රු 14 500

03.23 රක්ෂණ වාරිකය ගෙව්වා රු 8 500

අවශ්‍ය වන්නේ

1.බැංකු ගිණුම පිළියෙල කරන්න.